# ලංකා විදුලිබල මණ්ඩලය

## (කොළඹ නගරය)

### 2021 වර්ෂයට භාණ්ඩ හා සේවා සැපයුම්කරුවන් හා කොන්ත්‍රාත්කරුවන් ලියාපදිංචි කිරීම

2021 වර්ෂය සඳහා ලංකා විදුලිබල මණ්ඩලයේ කොළඹ නගර භාණ්ඩ හා සේවා සැපයීම සඳහා අලුතින් ලියාපදිංචි වීමට කැමති පිළිගත් භාණ්ඩ නිපදවන්නන්, බෙදාහරින්නන්, නියෝජිතයින්, සැපයුම්කරුවන්, කොන්ත්‍රාත්කරුවන් හා සේවා සපයන්නන්ගෙන් **කොළඹ නගර කාර්යාලය** විසින් අයදුම්පත් කැඳවනු ලැබේ.

__අයිතම් වර්ගය__

**(A) භාණ්ඩ**

M-1 MCCB, MCB, ELCB, RCCB කටවුට්ස්, පුලුසු පුරුක්, HRC පුලුසු, පුලුසු රඳවන.
M-2 නියුට්‍රල් පුරුක්, වෙනරු, ද්විලෝහ බඳවන, බහන් දිවත්,බඳවිලි (තඹ ඇලුමිනියම් හා දෙලෝහ), PG බඳවන, Line ටැප්ස් ABC සඳහා අවශ්‍ය උපාංග, ද්විලෝහ පින් සම්බන්ධක යනාදිය.
M-3 විදුලි උපකරණ, විදුලි පංකා, හැලජන් ලාම්පු ගැලපි, වීථි ලාම්පු හා ගැලපි, ප්‍රධාන වහරු, LED හදිසි ලාම්පු හා අනෙකුත් විදුලි උපාංග.
M-4 වෘත්තීයමය විදුලි ආරක්ෂක උපකරණ (ආරක්ෂිත සපත්තු, ෆුල් බොඩි හානස්, ගම් බූට්ස්, ආරක්ෂිත හිස් ආවරණ, වැහි කබා යනාදිය), ආරක්ෂිත ඇඳුම් පැළඳුම්, ආයුධ, මැනීම් උපකරණ, ඉනිමං,ගිනි නිවීමේ උපකරණ ,පරිවාරණය කරන ලද උපකරණ (පරිවාරණය කරන ලද අඬුව, පිහිය, ඉස්කුරුප්පු නියන, කේබල් කපන උපකරණ, ටෙස්ටරය, පරීක්ෂක උපකරණ) යනාදිය.
M-5 සියළුම වර්ගයේ තඹ හා ඇලුමිනියම් වෙනුල තත්, පිරියවන, බයින්ඩින් තත් හා වයින්ඩින් තත්
M-6 ගොඩනැගිලි ද්‍රව්‍ය, මුරිච්චි හා බෝල්ට, Hardware උපාංග, තීන්ත, රීයම් පත්‍ර, වොෂර්, දිදාල හා හිටු එකලස් යනාදිය.
M-7 ඉදිපිරිදි කට්ටල, යටිබහන් සඳහා සියළුම බූට්ස් වර්ග, බට, පටිවර්ග, බිටුමන් සංයෝගය, නලකැම් පැහැසි, ටින් සංයෝගය, නල කාන්දුව වළක්වන ද්‍රව්‍ය (නලවලට කේබල් ඇතුල්වන තැන් සීල් කිරීමට), ජල ප්‍රතිරෝධක ප්‍රසාරණය වන පෙන (Water Resistant Expanding foam)
M-8 මනුරු පෙට්ටි (PVC,වානේ හා වෙනත්), යකඩ පෙට්ටි, මනුරු පුවරු යනාදිය
M-9 ලිපි ද්‍රව්‍ය, කාර්යාල උපකරණ, කාර්යාලීය ගෘහ භාණ්ඩ යනාදිය
M-10 PVC කොන්ඩුයිට් ගැලපි හා PVC පයිප්ප, HDPE පයිප්ප හා උපාංග
M-11 මෝටර් රථ සඳහා ටයර් සහ ටියුබ්
M-12 වාහන බැටරි හා වියළි කෝෂ
M-13 පරිගණක හා පරිගණක ජාල සඳහා අදාළ අයිතම (පරිගණක,සර්වර්, මුද්‍රණ යන්ත්‍ර,ඡායා පිටපත් යන්ත්‍ර,අඛණ්ඩ ජව සැපයුම් (UPS), ෆැක්ස් යන්ත්‍ර,ප්‍රොජෙක්ටර්,පැමිණීම සටහන් යන්ත්‍ර, NAS ,ෆයර්වෝල්ස්, L3 ස්විච්ස්,රවුටර්ස්,නෙට්වර්ක් කේබල්ස්, කීස්ටොන්ස්,එන්ක්ලෝසර්,පැච් පැනල්,ෆේස් ප්ලේට්,ටූල්ස් යනාදිය)
M-14 සන්නිවේදන උපකරණ හා අදාල උපාංග, පැච් පුවරු (Patch Panel Enclosures), යටිබහන් ප්‍රකාශතන්තු පිරිද්දුම් කවර (Joint closures), ප්‍රකාශ තන්තු හා සන්නිවේදන උපකරණ වලට සවිකිරීමට අවශ්‍ය උපාංග Fibre Optic Cables and Accessories for Communication Equipment)
M-15 වීනට්වට්ටි/තන්‍ය යකඩ මනුබිල කවර (Cast Iron/Ductile Iron Manhole covers)
M-16 පරිගණක උපාංග (යතුරු පුවරු, මූසික,මොනිටර්,පරිලෝකන යන්ත්‍ර, ස්පීකර්ස්, ෆ්ලෑස් ඩයිව්, බාහිර දෘඩාංග තැටි ධාවක, ADSL රවුටර්, L2 ස්විච්ස් යනාදිය)
M-17 පරිගණක කොටස් (මවු පුවරු, රැම්, ප්‍රොසෙසර්, අභ්‍යන්තර දෘඩාංග තැටි ධාවක,බලය සැපයුම් ඒකක, DVD රයිටර්, හීට් සින්ක් හා කූලින් ෆෑන්, පරිගණක ආවරණ යනාදිය)
M-18 තාක්ෂණික උපකරණ සඳහා අවශ්‍ය පාරිභෝජන ද්‍රව්‍ය (Toner Cartridges & Ribbons)
M-19 ආසුත වතුර බෝතල්
M-20 නම්‍යශීලී කොන්ඩුයිට්/ප්ලාස්ටික්/වානේ,කේබල් ග්ලෑන්ඩ්ස්.
M-21 සෞඛ්‍ය ආරක්ෂිත උපකරණ (මුහුණු ආවරණ, ඇල්කොහොල් සැනිටයිසර්, වෛද්‍ය ඇස් ආවරණ, වෛද්‍ය මුහුණු පලිහ,ප්‍රථමාධාර පෙට්ටි
M-22 වාහන සඳහා අවශ්‍ය උපාංග (ඔඩියෝ කට්ටල, සෙන්සර් කැමරා, වයිපර් තල)
M-23 විදුලි පරීක්ෂණ උපකරණ (Clip-On Ammeter with Flexible CTs, Infrared Thermal Detectors)
M-24 රිලේ, කන්ටැක්ටර්, ඉන්ඩිකේෂන් ලැම්ප්ස්, ටයිමර්ස්.

**(B) සේවා**

S-1 මුද්‍රණ කටයුතු
S-2 ඇලුමිනියම් හා ලී පාටිෂන් කිරීම
S-3 උපපොල ගොඩනැගිලි ගොඩනැගීම හා ගොඩනැගිලි අලුත් වැඩියා කටයුතු සඳහා CIDA (ICTAD) හි ලියාපදිංචි වූ සිවිල් කොන්ත්‍රාත්කරුවන්
S-4 උපපොල ගොඩනැගිලි නඩත්තු, අංගන පිරිසිදු කිරීම් හා මංවර එළි කිරීම
S-5 වාහන සේවා කිරීම සහ අලුත්වැඩියා කිරීම
S-6 විදුලි හා විද්‍යුත්, විද්‍යුත් යාන්ත්‍රික හා යාන්ත්‍රික උපකරණ නඩත්තු කටයුතු හා වැඩපල කටයුතු
S-7 වරාය හා ගුවන් තොටුපල සිට ආනයනික ද්‍රව්‍ය නිදහස් කොට ප්‍රවාහනය කිරීම

S-8 ලී කණු, වැර කැවූ සහ පෙරසවි කොන්ක්‍රීට් කණු, ට්‍රාන්ස්ෆෝමර්ස් සහ අනෙකුත් භාණ්ඩ ප්‍රවාහනය
S-9 ලැප්ටොප්ස්, මුද්‍රණ යන්ත්‍ර, ස්කෑනර්ස්, මොනිටර්, යූපීස් යනාදිය අලුත්වැඩියා හා සේවා කටයුතු
S-10 සන්නිවේදන උපකරණ සේවා හා නඩත්තු කටයුතු
S-11 රක්ෂණ සේවා කටයුතු
S-12 පිරිසිදු කිරීම් වලට අදාළ සේවා කටයුතු
S-13 යටිබහන් එලීම, දෝෂ සොයාගැනීම, යටිබහන් මූට්ටු කිරීම හා අදාල කටයුතු
S-14 යටිබහන් ප්‍රකාශ තන්තු එලීම, තිරස් භූගත කැනීම් හා වෙනත් විවිධ සේවා
S-15 නිලඇඳුම් මැසීම හා සැපයීම
S-16 පුද්ගලික පාරවල් පුනස්ථාපනය කරන ගල්තාර එලීමේ කොන්ත්‍රාත්කරුවන්
S-17 පළිබෝධ පාලන සේවා කටයුතු
S-18 වායු සමීකරණ සැපයුම්කරුවන්, අලුත්වැඩියා කටයුතු හා සේවා කටයුතු සඳහා වායු සමීකරණ උපකරණ
S-19 ගිනි නිවීමේ උපකරණ අලුත්වැඩියා කටයුතු/නැවත පිරවීම හා සේවා කටයුතු

## (C) කුලී හා බදු

L-1 යන්ත්‍ර හා උපකරණ කුලියට හා බද්දට ලබාදීම
L -2 **ෆෝක් ලිෆ්ට් හා දොඹකර කුලියට ලබාදීම (කෙටි කාලීන)**

**පොදු කොන්දේසි**

අදාළ අයදුම්පත් 2020.11.12 සිට 2020.12.01 දින දක්වා නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (කොළඹ නගරය), ලංකා විදුලිබල මණ්ඩලය, 4 වන මහල, නො: 340, ආර්.ඒ.ද. මෙල් මාවත, කොළඹ 03 කාර්යාලයෙන් පෙ.ව. 10.00 සිට ප.ව. 3.00 දක්වා ලබා ගත හැක. අදාල එක් එක් අයදුම්පත සඳහා ආපසු නොගෙවනු ලබන රු. 500/- ක වටිනාකමකින් යුතු සාමාන්‍යාධිකාරී, ලංකා විදුලිබල මණ්ඩලය නමට ලියන ලද බැංකු අණකරයක් මගින් හෝ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (කොළඹ නගර) කාර්යාලයෙන් නිකුත් කරනු ලබන ගෙවීම් වවුචරයක් මගින් ගෙවීම කලයුතුය.

නියමිත පරිදි සම්පූර්ණ කරන ලද අයදුම්පත් නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (කොළඹ නගරය), ලංකා විදුලිබල මණ්ඩලය වෙත ලියාපදිංචි තැපෑලෙන් 2020.12.02 වන දින පෙ.ව. 10.00 ට පෙර ලැබෙන පරිදි එවීමට හෝ අතින් ගෙනවිත් කාර්යාලයේ ඇති ටෙන්ඩර් පෙට්ටියට 2020.12.02 වන දින පෙ.ව.10.00 ට පෙර බහාලීමට කටයුතු කලයුතුය. අයදුම්පත සහිත ලියුම් කවරයෙහි වම් පස ඉහළ කෙළවරේ "සැපයුම් හා කොන්ත්‍රාත්කරුවන් ලියාපදිංචි කිරීම - 2021" ලෙස සඳහන් කලයුතුය.

එක් එක් අයිතම් වර්ගය සඳහා ලියාපදිංචි වීමට කැමති අයදුම්කරුවන් එම එක් එක් අයිතම් වර්ගය සඳහා වෙන වෙනම අයදුම්පත් ඉදිරිපත් කල යුතු අතර වර්ෂය අවසානයේ නැවත ලබාගත හැකි රු. 5,000/- ක තැන්පතුවක් එම සෑම අයදුම්පතක් සමඟම ලබා දිය යුතුය. එම තැන්පතුව සාමාන්‍යාධිකාරී, ලංකා විදුලිබල මණ්ඩලය නමට ලියන ලද බැංකු අණකරයක් මඟින් හෝ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (කොළඹ නගර) කාර්යාලයෙන් නිකුත් කරන ගෙවීම් වවුචරයකින් හෝ ගෙවීම කල හැක.

2020.12.02 වන දින පෙ.ව. 10.00 න් පසුව ලැබෙන අයදුම්පත් භාරගනු නොලබන අතර ඒවා විවෘත කිරීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීමේ රෙගුලාසි සහ කොන්දේසි අයදුම්පත් සමග සපයනු ලැබේ.

**නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (කොළඹ නගරය)**
**ලංකා විදුලිබල මණ්ඩලය**

ලංකා විදුලිබල මණ්ඩලය
இலங்கை மின்சார சபை
CEYLON ELECTRICITY BOARD